# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/50 - 2022 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2022.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයීය නීතිය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 84 (7) වගන්තිය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු/හා ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් පවත්වාගෙන යන/ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කරනු මලාපවහන පද්ධතියට/ ජාලයට සම්බන්ධිතව ඇති පාරිභෝගිකයන්ගේ මලාපවහන ගාස්තු 2022.09.01 වැනි දින සිට පහත පරිදි සංශෝධනය කර ඇත.

2011 දෙසැම්බර් 28 දිනැති අංක 1738/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 2012 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මලාපවහන ගාස්තු සම්බන්ධයෙන් සඳහන් වන දැන්වීම වෙනුවට මෙම නිවේදනය අදාළ වේ.

කෙහෙළිය රඹුක්වැල්ල,<br>
ජල සම්පාදන අමාත්‍ය.

2022 අගෝස්තු මස 25 වැනි දින,<br>
ජල සම්පාදන අමාත්‍යංශය,<br>
බත්තරමුල්ල.

ඕනෑම පරිශ්‍රයක මාසික මලාපවහන ගාස්තුවට, පරිහරණ ගාස්තුව, මාසික සේවා ගාස්තුව , අතිකුත් ගාස්තු සහ අදාළ බදු ඇතුළත් වේ. ජල බිල්පතෙහි සාමාන්‍යයෙන් සම්පූර්ණ මාසික ජල/මලාපවහන ගාස්තුව දැක්වෙන අතර ඕනෑම පාරිභෝගිකයකුට තම ජල බිල්පතට අමතරව එකතු කළ අගය මත බදු/ අත්හිටවූ එකතු කළ අගය මත බදු ඉන්වොයිසියක් අවශ්‍ය වේ නම්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි පූර්ව ලියාපදිංචි වී එය ලබාගත හැක.

**ගාස්තු අයකුමය I**

ගෘහ අයකුමය - ගෘහ කටයුතු සඳහා සපයන මලාපවහන සේවා වෙනුවෙන් අයකරන ගාස්තු

| *ජල පරිභෝජනය (ඝණ මීටර)* | *මලාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 1-10 | 01.50 | 200.00 |
| 1-15 | 02.00 | 200.00 |
| 1-20 | 03.00 | 300.00 |
| 1-25 | 03.50 | 300.00 |
| 1-30 | 05.50 | 300.00 |
| 1-40 | 08.50 | 300.00 |
| 1-50 | 11.00 | 300.00 |
| 50 ට වැඩි | 13.50 | 300.00 |

**ගාස්තු අයකුමය II**

වාණිජ අයකුමය - රජයේ සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන, ආගමික ආයතන, රජයේ සහ පෞද්ගලික රෝහල්, රාජ්‍ය නොවන ආයතන, වෙළඳසැල්, සිල්ලර වෙළඳසැල්, ආහාර බැහැරගෙන යාමේ ආපනශාලා, සංචාරක හෝටල්, තානායම්, සහාධිපත්‍ය සහ මේ හැර ගෘහ සහ කර්මාන්ත නොවන සියළු සෙසු ආයතන

| *ජල පරිභෝජනය (ඝණ මීටර)* | *මලාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 0-10 | 67.50 | 1,000.00 |
| 11-50 | 67.50 | 2,000.00 |
| 51-500 | 88.00 | 5,000.00 |
| 500 ට වැඩි | 88.00 | 40,000.00 |

**ගාස්තු අයකුමය III**

කාර්මික අයකුමය - මහා පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සපයන මලාපවහන සේවා වෙනුවෙන් අයකරන ගාස්තු

| *ජල පරිභෝජනය (ඝණ මීටර)* | *මලාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 0-10 | 88.00 | 1,000.00 |
| 11-50 | 88.00 | 2,000.00 |
| 51-500 | 94.50 | 5,000.00 |
| 500 ට වැඩි | 94.50 | 40,000.00 |

කොන්දේසි :

1. සියළුම ජල ප්‍රභවයන් භාවිතා කරමින් සිදු කරනු ලබන අදාළ මාසයෙහි ජල පරිභෝජනය පදනම් කරගෙන ගෘහ කටයුතු සඳහා, වාණිජ කටයුතු සඳහා හා මහා පරිමාණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සපයන මලාපවහන සේවා වෙනුවෙන් ගාස්තු අයකරනු ඇත.

2. යම් මාසයක භාවිතය ශුන්‍ය වුව ද මාසික මලාපවහන සේවා ගාස්තුව සියලු පරිශ්‍රයන් සඳහා අදාළ වනු ඇත.

3. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සැපයුමට අමතරව වෙනත් විකල්ප ජල ප්‍රභව කිහිපයක් භාවිත කරන විට ඒ සඳහා පරිහරණ ගාස්තුව වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් පාරිභෝගිකයා විසින් ගෙවීම් කල යුතුය.

4. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ජල සැපයුම රහිතව මලාපවහන සේවා පමණක් ලබා ගෙන ඇති විටක මණ්ඩල නිලධාරීන් කණ්ඩායමක් විසින් පාරිභෝගිකයාගේ ද සහභාගිත්වයෙන් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසුව තීරණය කරනු ලබන ඇස්තමේන්තු අගයකට මලාපවහන ගාස්තුව නියම කරනු ඇත.

5. මලාපවහන සේවා ගාස්තු ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ සැපයුම විසන්ධි කිරීම. අදාල මාසයේ ජල ගාස්තු හා මලාපවහන ගාස්තු බිල්පත ලැබී දින 30 ක් ඇතුළත ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ ජල සැපයුම සහ/හෝ මලාපවහන සේවාව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 88 (I) වගන්තිය අනුව විසන්ධි කිරීම/ මෙහෙයුම් තත්වයෙන් ඉවත් කිරීම කරනු ඇත.

6. මලාපවහන සේවාව මෙහෙයුම් තත්වයෙන් ඉවත් කිරීම කළහොත් එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා නැවත සම්බන්ධන ගාස්තුවට අමතරව ඒ සඳහා වැයවන පිරිවැය ප්‍රමාණය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අදාළ පාරිභෝගිකයා විසින් ගෙවීම් කළ යුතුය.

EOG 08 - 0250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.